# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1636/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
25/10 /2024
පැය 1450

## මාධ්‍ය නිවේදනය

**01 යතුරුපැදි සොරකම් හා රන් මාල කොල්ලකෑම් ගණනාවක් සිදුකල සැකකරුවන් සිව්දෙනෙකු හා සොර බඩු ලඟතබාගත් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - යක්කල පොලිස් ස්ථානය.**

2024.10.20 හා 2024.10.21 වන දින වල යක්කල පොලිස් වසමේදී යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 250 ක්, හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 100, හෙරොයින් ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 320 ක් හා හෙරොයින් ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 450 ක් බැගින් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර වැඩිදුර විමර්ශන සඳහා රැඳවුම් නියෝග ලබාගෙන තිබුණි.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31,33 හා 35 වයස් වල පසුවන වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන්වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදු කළ වැඩිදුර විමර්ශනයේදී මොවුන් විසින් වැල්ලම්පිටිය, මිනුවන්ගොඩ, දෙමටගොඩ, ග්‍රෑන්ඩ්පාස් හා කිරිබත්ගොඩ පොලිස් වසම් වලදී සොරකම් කරන ලද යතුරු පැදි 06 ක් සොයාගෙන ඇත. තවද, සොරකම් කරන ලද මෙම යතුරු පැදි උපයෝගී කරගනිමින් ඉහත සැකකරුවන් විසින් රන්මාල කොල්ලකෑම් ගණනාවක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇති අතර ඒ අනුව, මොවුන් විසින් යක්කල, කඩවත, හා වේයන්ගොඩ පොලිස් වසම් වලදී කොල්ලකන ලද රන් මාල 13 ක් උකස් මධ්‍යස්ථාන වෙත උකස් කර තිබියදී සොයාගෙන ඇත.

තවද, ඉහත අපරාධ වලට අදාලව සොරබඩු සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් 2024.10.23 වන දින නුංගමුව හා පල්ලේවෙල පොලිස් වසම් වලදී තවත් සැකකරුවන් තිදෙනෙකු යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරුවන් අවුරුදු 21, 23 හා 37 වයස්වල පසු වන කුබල්ඔළුව හා පල්ලේවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

යක්කල පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

සොරකම් කල යතුරු පැදිවල ඡායාරූපයක් මේ සමග එවමි.

**02. ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනය කිරීමේ අපරාධයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.09.18 වන දින කොහුවල පොලිස් වසමේ නැදිමාල ප්‍රදේශයේ දී වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයට අදාළව බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශන සිදු කර 2024.10.25 වන අද දින උදෑසන කාලයේ මත්තේගොඩ පොලිස් වසමේදී මෙම වෙඩි තැබීම සඳහා සැකකරුවන් පැමිණි යතුරු පැදියේ පැදිකරු ලෙස කටයුතු කල පුද්ගලයා අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ උඩවලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම සැකකරු සම්බන්ධයෙන් සිදු කල වැඩිදුර විමර්ශනයේදී විදේශ රටක සිටින සංවිධානාත්මක අපරාධ වලට සම්බන්ධ පුද්ගලයෙකුගේ මෙහෙයවීම මත මෙම අපරාධය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී නිරීක්ෂණය වී ඇත.

කොහුවල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය**

2024.10.24 වන දින රාත්‍රී කාලයේදී පෑලියගොඩ පොලිස් වසමේ මල්වත්ත ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 06 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පෑලියගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**